GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2013/01/09

## මාධ්‍ය නිවේදනයයි

### ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතන හා මහරගම පිළිකා රෝහල් අධ්‍යක්ෂක ධුරය පිළිබඳ අර්බුදය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය පරිපාලනය පිලිබඳ අංක 1493/3 දරණ 2007.04.16 දිනැති සේවා ව්‍යවස්ථාවෙන් පැහැදිලි ලෙස ආයතන ප්‍රධානීන් පත් කිරීම පිළිබඳ විධි විධාන දක්වා ඇතත් 2014 වාර්ෂික ස්ථාන මාරු ලැයිස්තුවෙන් ඉහත තනතුරු දෙක ඉවත් කිරීම, එම විධි විධානයන්ට විරුද්ධව සිදු කිරීම සම්බන්ධව අපගේ විරෝධය පල කරමු.

2012 වාර්ෂික ස්ථානමාරු ලැයිස්තුවෙන් විධිමත් ලෙස පත්වූ වෛද්‍ය පරිපාලන ශ්‍රේණි නිලධාරීන්ට අංගොඩ රෝහලට වාර්තා කිරීමට ඉඩ නොදී, බලහත්කාරයෙන් වර්තමාන වැඩබලන අධ්‍යක්ෂකවරයා රැඳී සිටි අවධියේ අප සංගමය දැක්වූ දැඩි විරෝධතාව හමුවේ මෙම ගැටළුව විසඳීම සඳහා කමිටුවක් පත් කෙරුනේ ජනාධිපති ලේකම්තුමාගේ මැදිහත් වීමෙනි. එවර රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිර්දේශ කළේ කමිටු වාර්තාව ඉදිරිපත් කරන තුරු එම තනතුර ඇතුලත් කරන ලෙසය.

එම කමිටුවට ජනාධිපති උපදේශක ධම්මික අමරසිංහ මහතා සභාපති ලෙස පත්විණි. (ජනාධිපති ලේකම්ගේ 2013.02.06 දින ලිපිය) එම කමිටුවේ කරුණු විමර්ෂණය කිරීමෙන් පසු අවසාන නිර්දේශ වූයේ පවතින ක්‍රියා පටිපාටියට අනුව විධිමත් ලෙස අධ්‍යක්ෂවරයකු පත්කරන ලෙසයි.

තත්ත්වය මෙසේ තිබියදී මෙවර වාර්ෂික ස්ථාන මාරු ලැයිස්තුවෙන් එම තනතුර ඉවත් කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් PSC/APP/007/524-2013 දරන 2013.09.04 දිනැති ලිපිය මගින් දන්වා තිබීම පුදුම සහගතය.

මෙමගින් මෙම තනතුරට පත්වීමට සිටින ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන්ට බලවත් අසාධාරණයක් මෙන්ම කාර්යක්ෂම හා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ජනතාවට ලබා දීමට ඇති හැකියාවද තර්ජනයට ලක්ව ඇත.

අප සංගමයේ, අදාල ශාඛා මෙම අධ්‍යක්ෂවරුන්ගේ දුර්වල පරිපාලනය පිලිබඳ දැඩි විරෝධතාවය ප්‍රකාශ කර තිබෙන අතර, මෙමගින් සේවා පවත්වාගෙන යාමේ අපහසුතාවයන් උද්ගතව ඇත.

මෙලෙස අධ්‍යක්ෂකවරුන් පත්කිරීම වැරදි පූර්වාදර්ශයක් වන අතර, එය වහාම නිවැරදි කරන ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටින අතර එසේ නොකර සිටීමෙන් බිඳ වැටෙන රෝගී සත්කාර සේවාවල වගකීම අදාල බලධාරීන් දැරිය යුතු බව තරයේ අවධාරණය කරමු.

ස්තූතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර සඳහා : වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516